# UNIVERSITY GRANTS COMMISSION

**ESTABLISHMENTS CIRCULAR LETTER NO. 05/2022**

No. 20, Ward Place
Colombo 07

25th July, 2022

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**RESTRICTING THE CALLING OF OFFICERS TO GOVERNMENT CORPORATIONS, STATUTORY BOARDS AND GOVERNMENT OWNED COMPANIES**

Your attention is drawn to the Public Enterprises Circular No. PED 03/2022(I) of 14.07.2022 and to Public Enterprises Circular No. PED 03/2022 of 21.06.2022 adopted by the Establishments Circular Letter No. 04/2022 of 24.06.2022.

You are kindly requested to adhere to the instructions issued by the Public Enterprises Circular No. PED 03/2022(I) of 14.07.2022 in your respective University and Higher Educational Institute. A copy of the Public Enterprises Circular No. PED 03/2022(I) is enclosed herewith for your information and compliance.

**Senior Prof. Sampath Amaratunge**
Chairman

Copies:
1. Secretary/ Ministry of Education
2. Chairman's Office/UGC
3. Vice-Chairman/UGC
4. Members of the UGC
5. Secretary/UGC
6. Registrars of Universities
7. Deans of Faculties
8. Accountant/UGC
9. Bursars of Universities
10. Librarians/SAL/AL of the Higher Educational Institutions /Institutes
11. Deputy Registrars/ Snr. Asst. Registrars/Asst. Registrars of Campuses/Institutes
12. Deputy Bursars/Snr. Asst. Bursars/ Asst. Bursars of Campuses/Institutes
13. Internal Auditor/UGC
14. Govt. Audit Superintendents of Universities
15. Snr. Asst. Int. Auditors of HEIs
16. Secretaries of Trade Unions
17. Auditor –General

File No: UGC/HR/6/5/1

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.07.14

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2022 (I)

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්**

**<u>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වෙත නිලධාරීන් කැඳවීම සීමා කිරීම.</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2022.06.26 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/2022(I)ට අදාළව සහ ඉහත කරුණ සම්බන්ධයෙන් 2022.06.21 දිනැතිව භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2022 චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

2. දෛනික ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාරවල සේවකයින් මුහුණ පා සිටින ගැටළුකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන යථෝක්ත චක්‍රලේඛයෙහි 05 වන ඡේදයේ සඳහන් විධිවිධාන නැවත දැනුම් දෙනතුරු දීර්ඝ කරනු ලැබේ.

3. PED 03/2022 චක්‍රලේඛයේ සඳහන් අත්‍යාවශ්‍ය සේවා යටතට ගැනෙන ආයතනයන්හි වුවද, භාණ්ඩ හා සේවා සැපයීම් ක්‍රියාවලියට ඍජුවම සම්බන්ධ නොවන, විශේෂයෙන් කාර්යාලය තුල සේවය කරන සේවකයන් සඳහා නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය හා සේවා මුර ක්‍රමයට පැමිණීම සඳහා පහසුකම් සැලසිය යුතුය.

4. ඉහත PED 03/2022 චක්‍රලේඛය නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ වර්තමානයේ රටේ පවතින ඉන්ධන හිඟතාවයට පිළියමක් වශයෙන් සේවයට කැඳවනු ලබන සේවකයින් අවම කරගැනීම මගින් ඉන්ධන පරිභෝජනය අවම කිරීමයි. කෙසේ වෙතත්, එම චක්‍රලේඛයේ සඳහන් කර ඇති අත්‍යාවශ්‍ය නොවන සේවා සපයනු ලබන ආයතනවලටද ලබා දී ඇති පහසුකම් මෙකී අරමුණු ඉටු නොවන ආකාරයෙන් මේ වන විටත් කටයුතු කරන බවට වාර්තා වී ඇත. උදාහරණයක් ලෙස සේවකයින් සඳහා සංචිත ප්‍රවාහන පහසුකම් ලබා දෙන ඇතැම් ආයතන, සේවකයින් සඳහා සේවා මුර ක්‍රමයක් හඳුන්වා දී තිබුනද, සේවකයින් කිහිප දෙනෙකු පමණක් ප්‍රවාහනය සඳහා එම සංචිත වාහන නොකඩවා සේවයේ යොදවන බව වාර්තා වී ඇත. එවැනි අවස්ථාවලදී ඉන්ධන පරිභෝජනය අවමවන විකල්ප ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතුය.

5. සේවකයන් රාජකාරි කටයුතු සඳහා කාර්යාලයට වාර්තා කරන දිනයන්හිදී පවතින ප්‍රවාහන අපහසුතා හමුවේ කාර්යාලයට වාර්තා කිරීම හා පිටවීම පිලිබඳව නම්‍යශීලි අයුරින් කටයුතු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම රාජ්‍ය ව්‍යවසායන් විසින් සිදු කළ යුතුය.

6. එසේම, මෙම කාලය තුළ උපරිමයෙන් ඉන්ධන පිරිමසා ගත හැකි ආකාරයට ගමන් බිමන් සීමා කර සියලු රැස්වීම් සහ සාකච්ඡා මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට කටයුතු කළ යුතු අතර, හැකි සෑම විටකම විද්‍යුත් තැපැල භාවිතා කර ලිපි ලේඛන සන්නිවේදන කටයුතු සිදු කළ යුතුය.

7. තවද, ඇතැම් ආයතන ලබා නොගත් අසනීප නිවාඩු සඳහා වර්ෂ අවසානයේ ඒ වෙනුවෙන් මුදල් ගෙවීම් සිදුකරන බව නිරීක්ෂණය වන බැවින් 2022 වර්ෂය තුල එවැනි මුදල් ප්‍රතිපූර්ණය කිරීම් සිදු නොකල යුතුය.

8. මීට පෙර නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2022 හි සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් නොවෙනස්ව පවතින බවද දන්වා සිටිමි.

9. මෙම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2484627 මගින් රාජ්‍ය ව්‍යාපාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසිය යුතුය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන

භාණ්ඩාගාර ලේකම්